# ක්‍රිස්තියානි දේවස්ථානය

මේ වනාහි ක්‍රිස්තියානි ආගම අදහන ජනයාගේ ආගමික කටයුතු හා පූජකතුමන්ලාගේ කටයුතු සඳහා ඉදි කළ විශේෂ ගොඩනැගිල්ලයි. මෙය විවිධ ක්‍රම වලට, විවිධ ශෛලීන්ගෙන් යුක්තව විවිධ රටවල ඉදි කර ඇත.

## ක්‍රිස්තියානි දේවස්ථානයේ ඉතිහාසය-

ක්‍රිස්තුවර්ෂාරම්භයේ සිට ආසන්න වශයෙන් ක්‍රිස්තුවර්ෂ තුන්සියය පමණ දක්වා ක්‍රිස්තියානි දේවස්ථාන ඉදිවී තිබුණේ නැත. ක්‍රිස්තියානියට මෙ කල තිබූ බාධාවන් නිසා දේවස්ථාන ඉදි කිරීම හෝ අවම වශයෙන් ආගම ඇදහීම හෝ කළනොහැකි තත්ත්වයක් උදා වී තිබුණි.



ඩූරා යුරෝපස් හි දේවස්ථානයේ සංරක්ෂිත කොටස්

**ස්තෝත්‍ර පූජාව හෙවත් යූකරිස්තිය** උදෙසා පෞද්ගලිකව නිවාස වල රහසේ එක්රැස් වූ කිතුණුවෝ දේවස්ථානයේ අඩුව යම් තරමකට හෝ මගහරවා ගත්හ. එහෙත් බාධක අවම ප්‍රදේශ වල දේවස්ථාන වලට සම ගොඩනැගිලි තිබූ බවට සාධක ඇත. එහෙත් ඒවා සපුරා ම දේවස්ථාන නොවීය. හොඳ ම උදාහරණය වන්නේ රෝම අධිරාජ්‍යයට අයත්ව තිබූ ප්‍රදේශ වලින් පෙරදිග ප්‍රදේශයේ පැවති ඩූරා යුරෝපස් (Dura Europos) හි තිබී 1931 දී සොයා ගත් නටබුන් ය.




රෝමානු කැටකොම් ගෘහයක් හා කිතුණු ආගමික චිත්‍ර

සාමාන්‍ය නිවසකට සමාන වුවත් ආගමික චිත්‍ර වලින් යුක්ත වූ මෙය දළ වශයෙන් ක්‍රි.ව. 250ට පමණ අයත් වේ. දේවස්ථාන නොවූව ද මේ කාලයේ තිබූ බාධක මැදින් කිතු සමය හිස එසවූ තවත් ස්ථානයක් වූයේ **කැටකොම් (Catacombs)** නමැති සුසාන ගෘහයන්ය. මියගිය රෝමානුවන් වෙනුවෙන් පොළව යට ඉදිකළ මේවායේ ඇතුළත බිත්ති වල කිතු සමයට අදාළ සිතුවම් ඇඳ තිබුණි.

ආදම් සහ ඒව, මොසෙස් පර්වතයකින් වතුර ගැනීම, දානියෙල් සිංහයන්ගෙන් ආරක්ෂා වීම, කැකෑරෙන තෙල් තටාකයේ බැස නොපිළිස්සී සිටින තරුණයන් දෙදෙනා, තල්මසුන්ගෙන් ජීවිතය ගලවා ගන්නා ජෝනා ආදී සිතුවම් ඒ තුළ දැකිය හැක. මේවා දේවස්ථාන නොවූව ද දේව ඇදහිල්ල පිළිබඳ සාක්ෂි වේ.


එහෙත් ක්‍රි. ව. 313 දී කොන්ස්තන්තීනු අධිරාජයා විසින් නිකුත් කළ මිලාන් ආඥාවෙන් පසු ක්‍රිස්තියානිය ඇදහීම පිණිස සියල්ලන්ට නිදහස ලැබුණි. ඊට අනුව කිතුණු කලාව ද, ගෘහ නිර්මාණ ශිල්පය ද වර්ධනය වන්නට විය. මේ නිදහසින් පසු ක්‍රිස්තියානි දේවස්ථාන වර්ග දෙකක් ඉදි විය. රෝම අධිරාජ්‍ය යේ බටහිර කොටස මුල්කරගෙන රෝමානු දේවස්ථාන ක්‍රමය වර්ධනය වූ අතර පෙරදිග කොටස මුල් කරගෙන බිසෙන්තියානු(බයිසෙන්තියානු) ක්‍රමය වර්ධනය විය. කොන්ස්තන්තිනෝපලය (බිසෙන්තියම) පාලන මධ්‍යස්ථානය කරගත් ජුස්තීනියානු අධිරාජයා බිසෙන්තියානු දේවස්ථාන ඉදි කිරීමට විශාල අනුග්‍රහයක් දැක්වීය. මේ ආශ්‍රිතව මොසැයික (මොසැක්) කලාව හා අයිකොන් කලාව ද වර්ධනය විය. මොසැයික කලාව යනු ඊට පෙර පැවති වර්ණ ගල්කැට කලාවේ ම වර්ධනයකි. වර්ණ ගල් කැට වෙනුවට මේ කාලයේ වීදුරු කැට භාවිත විය.

බැසිලිකාව




මුල් කාලීන කිතුණු දේවස්ථාන ඉදි වීමට පෙර රෝමානුවන්ගේ ආගමික මධ්‍යස්ථන ඉදි වී තිබුණ ද කිතුණුවෝ මේ රෝමානු දේවස්ථාන ආදර්ශයට නො ගත්හ. ඊට හේතුව රෝමානු දේවස්ථාන පිටතින් බැලූ විට ගාම්භීර, ප්‍රතාපවත් ස්වභාවයක් ගත්ත ද ඇතුළත ඉඩකඩ සීමා වීමයි. කිතුණුවන්ට අවැසි වූයේ එකවර විශාල පිරිසකට එක්රැස් වී ආගමික කටයුතු කළ හැකි ස්ථානයකි. මේ නිසා ඔවුන් ආදර්ශයට ගත්තේ රෝම බැසිලිකාවන්ය. බැසිලිකාවක් යනු නඩු විසඳීම, උත්සව පැවැත්වීම වැනි අවශ්‍යතා උදෙසා රෝමානුවන් ඉදිකළ ගොඩනැගිලි විශේෂයකි. බැසිලිකාව තුළ විශාල ඉඩකඩක් විය. රෝමානුවන්ගේ සාම්ප්‍රදායික ආගමික ගොඩනැගිලි වලට වඩා මේවාට කිතුණුවෝ ප්‍රිය කළහ. ඊට අනුව බැසිලිකා ස්වරූපයේ දේවස්ථාන ගොඩනැගිලි ඉදි කළ කිතුණුවෝ සාමූහිකව ආගමික කටයුතු කිරීමේ අවශ්‍යතාව ඉටුකරගත්හ. බැසිලිකා අනුකරණය කළ නිසා මුල් කාලීන දේවස්ථාන බැසිලිකා නමින් හැඳින්වුණි. ක්‍රි.ව. පස් වන ශතකයේ දී රෝමයේ ඉදි කළ ශාන්ත සබීනා දේවස්ථානය මේ වර්ගයේ දේවස්ථානයකට හොඳ ම උදාහරණය යි. මේ වර්ගයේ දේවස්ථානයක ඇතුළත කොටස ප්‍රධාන කොටස් තුනකට බෙදී තිබුණි(රූපසටහන් බලන්න.) දේවස්ථානයේ වහලය දරා සිටීමට සහය වනු පිණිස ඉදි කළ කුලුනු දෙ පෙළ නිසා එසේ සිදු විය. මින් ප්‍රධාන කොටස හෙවත් මැද ශාලාව 'නැව' යන අරුත දෙන නේව් යන වදනින් ද දෙ පස කොටස් දෙක 'කුරුලු පිහාටු' යන අරුත දෙන අයිල් යන වදනින් ද හඳුන්වන ලදී. අයිල් කොටසේ වහලය නේව් කොටසට වඩා පහත්ය. මේ නිසා පිටතින් බැලූ විට පෙනෙන්නේ දෙ මහල් ගොඩනැගිල්ලක් ලෙස ය. මුල් කාලීනව

බැසිලිකාවක ඉදිරිපස



මේ ආකාරයේ ප්‍රධාන දේවස්ථාන 4ක් රෝමයේ ඉදි කරන ලදී.

1. ශාන්ත පේදුරු දේවස්ථානය.
2. ශාන්ත පාවුලු දේවස්ථානය.
3. ශාන්ත මේරි දේවස්ථානය.
4. ශාන්ත ජෝන් ලැටරන් දේවස්ථානය.

බැසිලිකා ආකෘතිය නිසා මේ සෑම ම දේවස්ථානයක ම නාමය අගට බැසිලිකාව යන උප වදන ද එක්විය. පසු කාලයේ රෝමානු ක්‍රමයේ දේවස්ථාන සේ හඳුන්වන්නට පටන් ගන්නේ මේ බැසිලිකාවන් ය. එහෙත් රෝම අධිරාජ්‍යයේ බටහිර කොටසේ ඉදිකළ බැසිලිකාවන්හි හැඩය තරමක් වෙනස් වග ද සිහි තබාගත යුතුය. ඒවායේ බිම් සැලැස්ම කුරුසියේ හැඩයට හෝ සම සතරැස්ව හෝ වෘත්තාකාරව සකසා තිබුණි. එහෙත් ඒ ක්‍රමයට සමස්ත රෝමයේ ම එතරම් කැමැත්තක් නොතිබුණි.



බිසෙන්තියානු ක්‍රමය හෙවත් බයිසෙන්තියානු ක්‍රමය ඊට වෙනස් ය. ඔවුන් වඩාත් අවධානය යොමුකළේ දේවස්ථානයතුළ දී බැතිමතුන් තුළ ඇතිවිය යුතු හැඟීම පිළිබඳව ය. ඊට අනුව ඔවුන් ගෞරවය ජනනය වන ආකාරයේ ගොඩනැගිලි ඉදි කළහ. එ කල රෝමානු ක්‍රමයේ දේවස්ථාන වල ඇතුළත පියස්ස(සීලිම) පැතලි වුව ද බිසෙන්තියානු ක්‍රමයේ දේවස්ථාන වල ඇතුළත පියස්ස අර්ධ කවාකාරය. ඍජු ආලෝකය වෙනුවට අරුණාලෝකයට සම තරමක් අඳුරු ආලෝකයක් පතිත වන ආකාරයට කවුළු සකසා තිබුණි. මේ ආකාරයේ හොඳ ම දේවස්ථානය ඉස්තාන්බුල් හෙවත් පැරණි කොන්ස්තන්තිනෝපලයේ ඉදි කළ ශාන්ත සොපියා දේවස්ථානය හැඳින්විය හැක. මේ ක්‍රමය බහුලව පැතිර ගියේ ග්‍රීක බස කථා කළ ජනයා වාසය කළ ප්‍රදේශ වලය. (කෙසේ වුව ද අද දක්නට ලැබෙන්නේ ඒ පැරණි සොපියා දේවස්ථානය නොවේ.



ශාන්ත සොපියා දේවස්ථානය හා එහා දැවැන්ත අර්ධගෝලාකාර ශිඛරය
(දැන් මෙය ඉස්ලාමීය පල්ලියකි)

පළමු ජුස්තිනියානු අධිරාජයා(483-565) විසින් ඉදිකරන දල දේවස්ථානය යි. ඒ පැරණි සොපියා දේවස්ථානය ගින්නකින් විනාශ වූ නිසාය. දේවස්ථානය නැවත ඉදිකළේ අඩි 107 ක විෂ්කම්භය සහිත දැවැන්ත අර්ධගෝලාකාර පියස්සක් සහිතවය. එය විස්මිත නිර්මාණයක් සේ පිළිගැනේ. මේ සමස්ත ගොඩනැගිල්ල ඉදි කිරීමට ගත වූයේ ද වර්ෂ 5ක් පමණි. දේවස්ථාන අභ්‍යන්තරය මොසැයික නිර්මාණ වලින් ද සරසා තිබේ. එහෙත් ක්‍රි.ව. 1453 දී කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කිවරුන් විසින් අල්ලාගත් පසු මේ දෙවස්ථානය මුස්ලිම් පල්ලියක් පවට පත් විය.)

ක්‍රි.ව. 1000-1500 අතර කාලය හෙවත් මධ්‍ය කාලීන අවධියේ දී දේවස්ථාන කලාව තවදුරටත් වෙනස් විය. මේ කාලයේ වඩා ප්‍රකට වූයේ රෝමනස්ක ක්‍රමය හෙවත් රෝමානු ක්‍රමය හා ගෝතික් ක්‍රමය යි. මෙ කල තවත් විශේෂත්වයක් වූයේ රදගුරු දෙව්මැදුරු ක්‍රමයක් ද වර්ධනය වීම යි. (කිතුණුවන් වාසය කළ ප්‍රදේශ දියෝකිසි(Diocese) වලට හෙවත් 'පදවි' වලටත් දියෝකිසිය වසම් හෙවත් මීසම් වලටත් බෙදා තිබුණි. වසම හෙවත් මීසම පාලනය කළේ සාමාන්‍ය පූජකයන් විසිනි. ඔවුන් ඒ ඒ වසමේ ජනයාට ප්‍රමාණවත් වන දේවස්ථානයක් පවත්වාගෙන ගියහ. දියෝකිසියේ පාලකයා වූයේ බිෂොප් වරයා හෙවත් රාජගුරු ප්‍රසාදි වරයාය. ඔහු වෙනුවෙන් වෙනම ම දෙවු මැදුරක් ඉදි විය. රාජගුරුප්‍රසාදි වරයාගේ නිල අසුන හෙවත් කැතීඩ්‍රලය(Cathedral) මේ දෙව්මැදුරේ තැන්පත් කර තිබූ නිසා ඒ දෙව්මැදුර ආසන දෙවුමැදුර හෙවත් කැතීඩ්‍රල් නමින් හැඳින්වුණි.) මධ්‍යකාලීන යුගයේ දී මේ ආසන දෙවු මැදුරු වඩාත් අලංකාරවත් විශාලවත් ශක්තිමත්වත් ඉදි කරවන ලදී.



ආසන දෙව් මැදුරක් හා එහි අභ්‍යන්තරය



කැතීඩ්‍රල් කිහිපයක්

## රෝමානු ක්‍රමයේ දේවස්ථාන



රෝමානු දේවස්ථානයක්

පැරණි ශෛලිය යි. මුල් කාලීනව රෝමයේ දේවස්ථාන ඉදි කළේ මේ ශෛලියෙනි. පසුකාලීනව නවාංග මුහු වුණ ද පැරණි ලක්ෂණ යම් තරමක් රැකී තිබුණි. රෝමනස්ක(Romanesque) යනුවෙන් හැඳින්වෙන්නේ මේ ශෛලියම ය.

අර්ධ කවාකාර ආරුක්කු බහුල වශයෙන් භාවිත වීම මේ ශෛලියේ විශේෂත්වයකි. දොරවල් හා ජනේල වලට ඉහළ බිත්තියේ ද එවන් ආරුක්කු සකසා තිබුණි. වියන්තලය ද අර්ධ කවාකාර විය. බිත්ති ඉතා ඝණකම් වූ අතර ඒ සමග සසඳා බැලූ විට කවුළු ඉතා කුඩා විය.

## ගොතික් ක්‍රමයේ දේවස්ථාන

ඉදිකිරීමේ ක්‍රමවේදය හා බාහිර හැඩය අතින් ද මේ ක්‍රමය රෝමානු ක්‍රමයට වඩා වෙනස්ය. එහෙත් අභ්‍යන්තරයේ වැඩි වෙනසක් නොවීය. රෝමානු ක්‍රමයේ දී මෙන් ම අභ්‍යන්තරයේ කුලුනු පේළි දෙකක් විය. එහෙත් ගොතික් ක්‍රමයේ දේවස්ථාන වල බිත්ති ඝණකමින් අඩු වූ අතර විශාල කවුළු සහිත විය. ඊට හේතුව ඔවුන් සොයා ගත් නව ඉදිකිරීම් ක්‍රමවේදය යි. මුල් කාලීන ඉදිකරන්නන් සිතා සිටියේ වහලයේ බර දරාගනු පිණිස බිත්ති ඉතා ඝණකම් වියයුතු බවයි. එහෙත් ගොතික් ශිල්පීන් කළේ වඩා ශක්තිමත් කණු ඉදිකර ඒ මත වහලය කරවා කණු යා කරමින් සිහින් බිත්ති කොටස් ඉදි කිරීමයි.



ගොතික් දේවස්ථානයක්

මේ ක්‍රමයේ දී බිත්ති වල විශාල කවුළු වුව නිර්මාණය කළ හැකි වූ නිසා දේවස්ථානය තුළට හොඳින් ආලෝකය පතිත විය. කවුළු විශාල වීම ගොඩනැගිල්ලේ ශක්තියට හානිකර නොවීය. එහෙත් වහලයේ බර නිසා කුලුනු වලට හානි වේ යැයි සිතූ අවස්ථාවල කුලුනු වල ශක්තිය වැඩි කිරීම පිණිස නිර්මාණශීලී මුක්කු ඉදි කළහ.

මේ දෙවස්ථාන ආශ්‍රිතව වර්ණ වීදුරු තහඩු කලාව ද වර්ධනය විය. ඒ වනාහි එතුවක් තිබූ වර්ණ ගල්කැට කලවේ හා වර්ණ වීදුරු කැට කලාවේ වර්ධනීය අවස්ථාවකි. මේ කලාව නිසා ගොතික් දේවස්ථාන තවත් හැඩ විය.

17වන සියවස උදාවත් සමග දේවස්ථාන ඉදිකිරීම් මන්දගාමී විය. නව ඉදිකිරීම් සිදුනොවී යැයි කීව ද නිවැරදිය. දේශගවේෂණ ව්‍යාපාරයේ ඵල ලැබෙමින් තිබූ කාලය නිසා රජවරුන් ප්‍රබල තත්ත්වයක සිටියහ. ඔවුන් වඩාත් උත්සාහ කළේ දේව මාළිගා වෙනුවට රජමාළිගා ඉදිකිරීමට ය. මේ අතර 1666 වර්ෂයේ ලන්ඩනයේ ඇති වූ මහා ගින්න නිසා එතුවක් තිබූ දේවස්ථාන ද විනාශයට පත් විය.

දැවැන්ත දෙව් මැදුරක් වූ ශාන්ත පෝල් දේවස්ථානය එහෙමපිටින් ම ගිනිබත් විය. එහෙත් ක්‍රිස්ටෝපර් රෙන් නමැති මහා ඉංජිනේරුවා ඉදිරිපත් වී නගරයේ ආගමික ගොඩනැගිලි ඇතුළු බොහෝ පොදු ගොඩනැගිලි යළි ඉදිකිරීමට සැලසුම් කළේය. ඔහු විසින් ලන්ඩනය ආශ්‍රිත දේවස්ථාන 50ක් පමණ ද තවත් එ වැනි ම ප්‍රමාණයක් පොදු ගොඩනැගිලි ද සැලසුම් කරන ලදී. මේ වනාහි මේ යුගයේ සිටි සුවිශේෂ ගෘහ නිර්මාණ ශිල්පියෙක් යැයි පිළිගැනේ.

මේ අතරවාරයේ තවත් කලාවක් වර්ධනය විය. ඒ දේවස්ථාන සැරසීමේ කලාව යි. මුලින් ම මේ සඳහා යොදා ගත්තේ බැරොක් කලාවයි. විසිතුරු බවින් අධික වීම හා සංකීර්ණ බවින් යුතු වීම බැරෝක් කලාවේ විශේෂත්වයකි. බැරොක් කලාවේ විශිෂ්ටයෙකු සේ පිළිගැනෙන්නේ ගියන් ලොරන්සො බර්නිනිය(Gian Lorenzo bernini1598-1680) මාටින් ලූතර්ගේ ආගමික විප්ලවයෙන් පසු කිතුණු දහම දෙ කඩ වීමත් සමග විවිධ දේවස්ථාන ද ඉදි විය. ඒ නිසා ඒවා ආශ්‍රිතව විවිධ කලාවන් ද වර්ධනය විය.



බැරොක් කලාව

ඊට අනුව බැරොක් කලාවට අමතරව රොකොකෝ කලාවද, පශ්චාත් බැරොක් කලාව ද වර්ධනය විය.

සිප්පිකටු සැරසිලි යන අරුත ඇති රොකොකෝ වදනින් නිදහස් කලාවේ මුල් අවස්ථා දැක්වුණි. නිශ්චිත රාමුවකින් තොරව නිදහස් සැරසිලි ක්‍රමයක් අනුගමනය කළ රොකොකෝ කලාව වඩාත් වර්ධනය වූයේ බල්තසාර් නිව්මන් (Balthasar Newnam1687-1753) නමැති ශිල්පියා යටතේ ය. එහෙත් ඔසුට්‍රියාව, දකුණු ජර්මනිය වැනි පෙදෙස් වල පැතිර ගිය ද බැරොක් කලාවට තරම් රොකොකෝ කලාවට ආයුෂ තිබුණේ නැත.



රොකොකෝ කලාව

19 වන සියවසේ දේවස්ථාන ඉදි කිරීම සම්බන්ධයෙන් වඩාත් කතාබයට ලක් වූ වාස්තු විද්‍යාඥයා වූයේ ඔගස්ටස් වෙල්බි පියුගින් ය. හේ ලන්ඩනය කේන්ද්‍ර කරගනිමින් ගොඩනැගිලි විශාල ප්‍රමාණයක් සැලසුම් කළා පමණක් නොව විප්ලවීය සංකල්පනා ද බිහි කළේය. ඔහු විශ්වාස කළ පරිදි රෝමානු කතෝලිකයන්ට වඩාත් උචිත කලාව වූයේ ගොතික් කලාව යි. බර්මින්හැම්, සවුත්වර්ක්, නිව්කාසල්, නොටිංහැම් වැනි නගර වල ගොතික් ක්‍රමයේ දොවස්ථාන රැසක් සැලසුම් කළ මොහු අයර්ලන්තයේ කිලානි හා එනිස්කෝනි හි ද දේවස්ථාන දෙකක් සැලසුම් කළේය. සාමාන්‍ය මනුෂ්‍යයෙකුට ජීවිත කාලය තුළ කළ නොහැකි තරම් ප්‍රමාණයක නිර්මාණ ගොන්නක් සමග විප්ලවීය සංකල්පනා ද ලොවට දායාද කළ පියුගින් කාර්යබහුලභාවය නිසා ම දෝ වසර 40කට වඩා අයු වින්දේ නොවේ. එහෙත් ඔහුගේ නිර්මාණ හා සැලසුම් අදත් ලෝකය පුරා කතාබහට ලක්වන්නා සේ ම ප්‍ර යෝජනයට ද ගැනේ. The true principles of pointed or Christian Architecture නමැති ග්‍රන්ථයෙන් ඔහු දේවස්ථාන කලාව පිළිබඳව සිය මතවාද ප්‍රකාශ කර තිබේ. තාක්ෂණය දියුණු වුව ද මින් පසු කාලයේ සැලකියයුතු තරම් නිර්මාණයන් සිදු වී යැයි කියන්නට නොහැකිය. නිර්මාණාත්මක දේවස්ථාන කලාවේ යම් පසුබෑමක් දක්නට ලැබේ.